**සීමාසහිත මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම - 2017**

---

සීමාසහිත මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) අනුව ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලයුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) සමාගමේ සාංගමික සංස්ථාපත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු.10 කොටස් 5,000,000 කින් සමන්විත වී තිබුණු අතර ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් 2017 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත්කර නොතිබුණි.

නිකුත්කර තිබූ කොටස් තුනම වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත ලබාදී තිබුණු අතර මහවැලි අධිකාරියේ හිමිකාරිත්වය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව මෙම සමාගම අධිකාරියේ පූර්ණ හිමිකම සහිත පරිපාලිත සමාගමක් ලෙස දක්වා තිබූ අතර, එම සමාගමෙහි රු.418,871,277 ක ආයෝජනයක් පෙන්වා තිබුණු නමුත් ආයෝජනයටද කිසිදු ප්‍රතිලාභයක්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබාදී නොතිබුණි.

(ඇ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල 17 වන පරිච්ඡේදයෙහි 17.19 වගන්තිය අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පොත් අගය රු.7,313,171 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල 28 වන පරිච්ඡේදයෙහි 28.18 වන වගන්තිය අනුව පාරිතෝෂික වෙන්කිරීමේදී පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය හෝ ඒ හා සමාන වෙනත් ක්‍රමයක් අනුගමනය කළ යුතු වුවද, සමාගම විසින් සේවකයින් අවසන්වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන පාරිතෝෂික වෙන්කිරීම සිදුකර තිබුණු අතර එම පදනමට සිදුකල ප්‍රතිපාදනය හා විගණනයේ ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයට අදාලව පාරිතෝෂික වෙන් කිරීම් රු.1,216,096 ක් අඩුවෙන් වෙන්කර තිබුණි.

(ඉ) ගිණුම් ප්‍රතිපත්ති අනුව ගිරාදුරුකෝට්ටේ ගොවිපලේ ගොඩනැගිලිවල ඵලදායී ජීවිත කාලය වසර 20 ක් වුවද, ගොඩනැගිලි 02 ක ඵලදායී ජීවිත කාලය වසර 40 ක් ලෙස හා ගොඩනැගිලි 05 ක ඵලදායී ජීවිත කාලය වසර 10 ක් ලෙස සලකා ක්ෂය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී ක්ෂය ප්‍රමාණය රු.187,859 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වර්ෂයේ තොග අඩුවීම රු.941,552 ක් හා ලැබියයුතු ශේෂ අඩුවීම රු.17,730,475 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන විචලනය යටතේ එම ගැලපීම් සිදුකර නොතිබුණි.

(උ) හඳුනා නොගත් අන්තර් ගොවිපල ණයගැති ශේෂ වටිනාකම රු.14,117,550 ක් අවිනිශ්චිත ගිණුමක ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ඌ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මුදල් හා මුදල් සමාන ඈ වල වටිනාකම රු.581,165 ක ඍණ ශේෂයක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.313,324 ක් ධන අගයක් ලෙස දක්වා තිබුණි.

(එ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත, උපකරණ පිරිවැය හා ගෙවිය යුතු එකතුකළ අගය මත බදු වටිනාකම පිළිවෙලින් රු.102,562,998 ක් හා රු.2,991,095 ක් වුවද ලෙජර් ගිණුම හා උපයෝගී ලේඛන අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.102,473,179 ක් හා රු.2,499,005 ක් වීමෙන් රු.89,819 ක හා රු.492,090 ක පැහැදිලි නොකළ වෙනසක් විය.

(ඒ) පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| පොදු සංචිතය | | |
| මහවැලි ආර්ථික ඒජන්සිය | 403,962,731 | වටිනාකම සනාථකරගත හැකි සාක්ෂි |
| කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | |
| යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කිරීමට අදාල ලියවිලි |
| විදේශ ආධාර | 5,729,782 | |
| ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 285,185 | (i) තහවුරු කිරීම්<br>(ii) බදු සහතික පත්‍ර |
| මහවැලි පශු සම්පත් සමාගමෙන් ලැබිය යුතු | 1,030,137 | ශේෂ තහවුරු කිරීම් |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ගෙවියයුතු | 165,600 | |

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

#### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වෙත පවරා තිබුණු නිරාවිය ගොවිපල සතුව තිබුණු රු.5,820,430 ක් වූ පශු සම්පත් තොගයේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානවන විටද අයකර ගෙන නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය. | 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී 03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 2.2 ඡේදය | සමාගම් වර්ගීකරණයේ අනුකණ්ඩ "එෆ් " යටතට ගැනෙන රජය සතු සමාගම්වල මාසික දීමනාව ලබාගැනීම සඳහා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලබාගතයුතු වූවත්, සමාගම විසින් රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබානොගෙන එක් අධ්‍යක්ෂවරයෙකුට රු. 60,000 ක මාසික දීමනාවක් ගෙවා තිබුණි. |
| (ii) 2.10 ඡේදය | අධ්‍යක්ෂවරයෙකුට ගෙවන මාසික දීමනාව හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවන රැස්වීම්වලට සහභාගීවීමේ දීමනා වලින් රඳවා ගැනීමේ බදු මුදල් අයකළ යුතු වූවද, අධ්‍යක්ෂවරයෙකුට ගෙවන ලද රු.60,000 ක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් 03 දෙනෙකුට ගෙවන ලද රු.80,000 ක රැස්වීම්වලට සහභාගීවීමේ දීමනා වලින් රු.14,000 ක බදු මුදල් අයකර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාල කාර්යය අවසන් වූ වහාම ලබාගත් අත්තිකාරම් නිරවුල්කල යුතු වුවද තාවකාලික වවුචර් මගින් මාස 18 කට පෙර ලබාගෙන තිබුණු රු.43,936 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල්කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,421,557 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,025,739 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.395,818 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම රු.871,770 කින් අඩු වී තිබුණද ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් උපයන ලද ලාභය රු. 1,255,075 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ මූලික අරමුණු 12 ක් දක්වා තිබුණද, සමාගමේ ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම, තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව, ඌරන්, කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර නොතිබුණු අතර මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට පශු සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ක්‍රියාකාරකම් යටතේ ඉලක්කගත නිෂ්පාදනය තත්‍ය නිෂ්පාදනය සමඟ සැසඳීමේදී බොයිලර් කුකුල් මස් නිෂ්පාදනය සියයට 45 ක්ද, ඌරු මස් නිෂ්පාදනය සියයට 4 ක්ද, එළුවන් ඇතිකිරීම සියයට 28 ක්ද, මී හරක් ඇතිකිරීම සියයට 38 ක්ද වශයෙන් අඩු අගයක් ගෙන තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ වත්කම් සත්‍යාපනයේදී අපහරණය කිරීමට නිර්දේශකර තිබුණු රු.859,256 ක් වටිනා අබලි ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අපහරණය කර නොතිබුණි.

(ආ) සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රු.3,162,812 ක් වූ,වාහන 04 ක් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටි මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු. 14,929,159 ක් ලෙස දක්වා තිබුණද එම ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී සිදුකළ වැටුප් සංශෝධනයට අනුව සේවකයින්ට ගෙවිය යුතු රු.8,070,961 ක හිඟ වැටුප් සහ ඊට අදාල රු.1,817,553 ක සේවක අර්ථසාධක හා සේවක භාරකාර

අරමුදල් දායකත්වය සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඒවා ගෙවා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.655,202 ක් වූ කිරි ආශ්‍රිත නිෂ්පාදනවල භෞතික තොගයේ පැවැත්ම තහවුරු කරගැනීමට තොග සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

(ඉ) සමාගමේ කිරි ප්‍රවාහනය සඳහා තෝරාගන්නා පුද්ගලයන් විසින් රු.10,000 ක මුදලක් සමාගම වෙත තැන්පත් කළ යුතු වුවත්, එසේ තෝරාගත් පුද්ගලයින් 03 දෙනෙකු අදාල තැන්පත් කිරීම සිදුකර නොතිබුණි.

(ඊ) ගිරාදුරුකෝට්ටේ ගොවිපල තුළ පිහිටුවා තිබුණු කිරි සැකසුම්හල ආරම්භ කරන ලද 1986 වර්ෂයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර මගින් කිරි නිෂ්පාදන කටයුතු සිදුකරමින් තිබුණි. කර්මාන්තශාලා ගොඩනැගිලි පැරණිවීම හේතුවෙන් පරිශ්‍රයේ බිම ටයිල් කැඩී ගොස් තිබීම, වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලාව තුළට පැමිණීම, කානු පද්ධතිය අබලන්වීම, අභ්‍යන්තර පිරිසිදු කිරීම් පද්ධතිය දුර්වලව පැවතීම ආදී කරුණු නිසා සෞඛ්‍යාරක්ෂිත ගැටළු පැනනැගී තිබුණි. මෙවැනි දුර්වල පරිසර තත්ත්වයන් මත නිෂ්පාදන කාර්යයන් සිදුකිරීම නිසා ඉදිරියේදී නීතිමය ගැටළු පැනනැගීමට හැකිබව නිරීක්ෂණය විය.

(උ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සේවකයාගේ වැටුපෙන් අඩුකරන ලද හා සේව්‍යයා විසින් වෙන්කරන ලද පිළිවෙලින් රු.8,713,984 ක් හා රු.627,785 ක් වූ ගෙවියයුතු දායක මුදලක් නොගෙවා තිබීම නිසා ඉදිරියේදී සමාගමට අධිභාර ගෙවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දින වනවිට සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණු ගොවිපලවල් 05 කට අයත් රු.21,359,381 ක් වටිනාකමැති වත්කම් සමාගම විසින් ලිඛිත අනුමැතියකින් තොරව අවිධිමත් ලෙස මහවැලි අධිකාරිය වෙත පවරා තිබුණි.

(ආ) දින 45 සම්පූර්ණ වූ සමාගමේ බොයිලර් වර්ගයේ කුකුළු පැටවුන් මස් පිණිස අලෙවි කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වන අතර ගොවිපලේ තිබූ ශීතකාමරය අක්‍රීයවීම හේතුවෙන් දින 45 ට වඩා වැඩි කාලයක් බොයිලර් කුකුලන් අලෙවි නොකර තබාගැනීමට සිදුවීම නිසා එම සතුන්ට ආහාර දීම සඳහා පමණක් රු.2,687,262 ක අමතර වියදමක් දැරීමට සිදු වී තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

සමාගම සතු ගිරාදුරුකෝට්ටේ ගොවිපල සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් මහවැලි අධිකාරියේ “සී” කලාපය විසින් 2014 හා 2015 වර්ෂවලදී රු.12,501,900 ක් වැයකර ඉදි කරනලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු.8,967,600 කට අගයකර 2016 පෙබරවාරි 08 දින මෙම සමාගමට පවරා දී තිබුණි. වෙනත් පාර්ශවයන් විසින් ඔවුන්ගේ අරමුණක් ඉටුකර ගැනීම සඳහා සකස් කර තිබුණු මෙම ඉදිකිරීම් සමාගමට පවරාදී තිබුණද, මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින් පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2010 ඔක්තෝබර් සිට රේඛීය අමාත්‍යාංශය යටතට ගෙන තිබූ සමාගම සතු නිරාවිය ගොවිපල වෙත අනුයුක්තව සිටි සමාගමේ සේවකයින් 06 දෙනෙකුගේ වැටුප්, සේවක අර්ථසාධක සහ සේවකභාරකාර අරමුදල් දායක මුදල් අමාත්‍යාංශය විසින් හා 2016 මාර්තු සිට මහවැලි අධිකාරිය විසින් ගෙවමින් පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු අයවැය ලේඛනයේ අයවැයගත දත්ත හා තත්‍ය දත්ත අතර සියයට 22 සිට සියයට 93 දක්වා පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතාවයන් වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇතැම් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම |
| (ආ) ණයගැති හා ණයහිමි පාලනය | දිගුකාලයක් නිරවුල් නොවී පවතින ශේෂ නිරවුල් කරගැනීමට පියවර නොගැනීම |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | සමාගම සතු මානව සම්පත් බාහිර පාර්ශවයන්ට ලබාදීම නිසි කළමනාකරණයකින් සිදුනොවීම. |
| (ඈ) මෙහෙයුම් පාලනය | සාංගමික සංස්ථාපත්‍රයේ සඳහන් ඇතැම් අරමුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම |
| (ඉ) වත්කම් පරිපාලනය | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම සහ වෙනත් පාර්ශවයන් සතු වත්කම් නිරවුල් කර ගැනීමට කටයුතු නොකිරීම. |